# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2046/11 - 2017 නොවැම්බර් මස 21 වැනි අඟහරුවාදා - 2017.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වන වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, මහා නගර හා බස්නාහිර සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛන අංක I සහ II විස්තර කර ඇති ඉඩම් කොටස් පිළිවෙලින්, මිශ්‍ර සංවර්ධන (නිවාස) ව්‍යාපෘතියක් සඳහා සහ අඩු පහසුකම් සහිත ජනාවාසවල පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම පිණිස මහල් නිවාස ඉදිකිරීම සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් අදාළ කාර්යයන් සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 නොවැම්බර් මස 20 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

උපලේඛනය I

1A - G 26626 - 17 (2017/11)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුවාරපොල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කො/කේඑස්බී/2017/150 හා 2017.05.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 01න් දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 12, රූඩ් 00, පර් 28.3 ක් (හෙක්. 4.9277) පමණ වන ඉඩම් කොටසට අදාල මායිම් පහත පරිදි වේ.

*උතුරට* - කඩඉම් සිතියමේ අංක 521201 හි කලාප අංක 04 කැබලි අංක 39, 27, 26, 24, 23, 22, මොරටුව පාර (කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 01), කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 04 කැබලි අංක 20, 21, 19, 16, 15, 46, 9 සහ 56.

*නැගෙනහිරට* - කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 21, 19, 16, 15, 46, 9, 56 කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 03 හා ප්‍රවේශ මාර්ගය.

*දකුණට* - කඩඉම් සිතියම් අංක 521201 හා කලාප අංක 03, කඩඉම් සිතියම් අංක 52120104 හි කලාප අංක 04 හි කැබලි අංක 100.

*බටහිරට* - 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 97, 90, 89, 84, 74, 73, 64, 58, 45, 44, 39, 27, 26, 24, 23 සහ 22.

## උපලේඛනය II

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස මහා නගර සීමාවේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටුබැද්ද ගමේ (කොට්ඨාස අංක 551) පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 520205 දරන 2009.10.20 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 9 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 4 රූඩ් 03 පර්. 2.26 (හෙක්. 1.9288) පමණ වූ දෙල්ගහවත්ත (බැටරිවත්ත) නැමති ඉඩමට මායිම් පහත පරිදි වේ.

*උතුරට* - ශ්‍රී රාහුල මාවත, අංක 520205 දරන කැඩැස්තර සිතියමේ කැබලි අංක 89 සහ 98, බොල්ගොඩ වැව.

*නැගෙනහිරට* - බොල්ගොඩ වැව.

*දකුණට* - සිමෙන්ති කාණුව, මායිම් තාප්පය, අංක 520205 දරන කැඩැස්තර සිතියමේ කැබලි අංක 101, 100, 226 සහ 225.

*බටහිරට* - ප්‍රවේශ මාර්ගය (කැබලි අංක 10), අංක 520205 දරන කැඩැස්තර සිතියමේ කැබලි අංක 22 සහ 102.

12 - 94

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.